M865

T

# පෙර පාසල් අධ්‍යාපනය අවසන් කරන ශ්‍රී ලංකාවේ දරුවන් විසින් සාධනය කර ගත යුතු නිපුණතා පිළිබඳ අධ්‍යයනයක්

කේ. වී. සුදර්මා හරිස්චන්ද්‍ර

UCLIB
564678

University of Colombo Library Sri Lanka

අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතා පූරණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

2008/ Mphil/ 06

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය

2011 මාර්තු

## සංක්ෂිප්තය


පෙර ළමා විය, පුද්ගල ජීවිත පූර්ණ සංවර්ධන ක්‍රියාවලියේ පදනම සම්බන්ධ තීරණාත්මක අවධියකි. ශ්‍රී ලංකාවේ වත්මන් සමාජ ආර්ථික පසුබිම අනුව පෙර පාසල් අධ්‍යාපනය අත්‍යවශ්‍ය වී ඇත. පෙර පාසල් අධ්‍යාපනය නිවැරදි මාවතකට යොමු කරමින් පූර්ව ළමා වියේ දරුවන් තුළ, සාධනය කළ යුතු නිපුණතා යෝග්‍ය ක්‍රියාකාරකම්වලින් ලබා දීම අවශ්‍ය ය. මෙම පදනම මත අධ්‍යයනයේ අරමුණ පෙර පාසල් අධ්‍යාපනය අවසන් කරන ශ්‍රී ලංකාවේ දරුවන් විසින් සාධනය කර ගත යුතු නිපුණතා අධ්‍යයනය කිරීම ය.

සුවිශේෂි අරමුණු 4ක් ඔස්සේ පර්යේෂණ ප්‍රතිවේදය ලබා ගැනීමට කොටස් දෙකකින් යුක්ත ව සාහිත්‍යය විමර්ශනය කරන ලදී. න්‍යායාත්මක පදනම සහ පර්යේෂණ සාහිත්‍යය ලෙස ය. පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයේ දී දේශීය සාහිත්‍යය විරල වූ අතර විදේශීය සාහිත්‍යය ප්‍රමාණවත් ලෙස විමර්ශනය කළ හැකි විය.

විස්තරාත්මක ක්‍රමවේදය අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. දත්ත අදියර දෙකකින් රැස් කෙරිණි. පළමු අදියරේ දී රැස් කළ දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව නිපුණතා ලැයිස්තුවක් සකස් කොට එය දෙවන අදියරේ දී අතුරු නියැදියක් වෙත යොමු කොට අවසන් නිපුණතා ලැයිස්තුව සකස් කරන ලදී. පළමු අදියරේ අධ්‍යයන නියැදියට පෙර පාසල් 30ක් සහ පෙර පාසල් ගුරුවරුන් 100ක් ද, ප්‍රාථමික ශ්‍රේණි සහිත පාසල් 30, පළමුවන ශ්‍රේණි භාර ගුරුවරියෝ 100ක්, පළමුවන ශ්‍රේණියට ඇතුළත් වූ දරුවෝ 200ක් ,දෙමාපියවරු 20ක්, විද්වත්තු 05ක් අයත් වූහ. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මගින් දත්ත රැස් කරන ලදී. විවිධ ප්‍රවේශ මාර්ගයෙන් ලබා ගත් දත්ත ත්‍රිකෝණීකරණ කර ලදී. පළමු අදියරේ දී නියැදියට ඇතුළත් වූ පෙර පාසල් ගුරුවරියන්ගෙන් සහ පළමුවන ශ්‍රේණි භාර ගුරුවරියන්ගෙන් 10% ක් වන අතුරු නියැදියකට යොමු කොට දත්ත රැස් කොට විශ්ලේෂණයෙන් අනතුරු ව පෙර පාසල් අධ්‍යාපනය අවසන් කරන දරුවන් විසින් සාධනය කර ගත යුතු නිපුණතා ලැයිස්තුව සකස් කරන ලදී.

- පූර්ව පාසල් ආයතනවල පැවතුම් රටාව, සාමාන්‍ය පාසල්වල භාවිත වන පාසල් නිවාඩු කාල, දින පහේ සතිය, පාසල ඇරඹීම සහ අවසාන වීම යන මේ ක්‍රියාමාර්ග සියල්ල ම සහිත රටාවම ය. මේ අනුව පූර්ව පාසල් "කුඩා ප්‍රාථමික පාසල් " ලෙස හැඳින්වීම යෝග්‍ය ය.

- ප්‍රාථමික ශ්‍රේණිවල නිපුණතා ලබා දීම කෙරෙහි පෙර පාසල් ද අවධානය යොමු කර ඇත.
- පෙර පාසල් 80%කම සිංහල මිශ්‍ර ඉංග්‍රීසි භාෂාවක් භාවිත වේ.
- පෙර පාසල් අධ්‍යාපනය අවසන් කරන ශ්‍රී ලංකාවේ දරුවන් විසින් සාධනය කළ යුතු නිපුණතා ක්ෂෙත්‍ර 6ක් යටතේ ගොනු කළ හැකි ය.

1. ශාරීරිත නිපුණතා (දළ සහ සියුම්)
2. පුද්ගල හා සමාජ සංවර්ධන නිපුණතා
3. සන්නිවේදන නිපුණතා
4. නිර්මාණාත්මක නිපුණතා
5. භාෂා සංකල්ප ආශ්‍රිත නිපුණතා
6. මූලික ගණිත සංකල්ප නිපුණතා ලෙසය.

ශාරීරික නිපුණතා(දළ) ක්ෂෙත්‍රයට නිපුණතා 5ක් අයත් වෙයි.එනම්;

ඇවිදීම සහ වාඩි වීම සඳහා නිවැරදි ඉරියව් භාවිත කරයි.

නැගීම සහ බැසීම, පැනීම යන නිපුණතා ප්‍රදර්ශනය කරයි.

බිම රෝල් වෙයි.

බැලුන් පුම්බයි.

ඔන්චිලි පදියි.

ශාරීරික නිපුණතා( සියුම් ) ක්ෂෙත්‍රයට නිපුණතා 6 කි. එය පහත සඳහන් පරිදි ය.

පැන්සල නිසි ලෙස අල්ලයි.

පොතේ නියමිත පිටුව පෙරලා ගනියි.

කැබලි වෙන් කළ පින්තූර සම්පූර්ණ කොට අලවයි.

කතුර නිවැරදිව භාවිත කරයි.

ඉරටුවකට මල් ආදිය අමුණයි.

රූපයක සීමාව තුළ පාට කරයි.

පුද්ගල හා සමාජ සංවර්ධන නිපුණතා ක්ෂෙත්‍රයට අනු නිපුණතා 12කි. එය පහත පරිදි ය.

ශරීර අවයව හඳුනා ගනියි.

තම වාරය එනතුරු ඉවසයි.

අවසානය දක්වා වැඩ කරයි.

නායකත්වය ගැනීම සහ නායකත්වය පිළිගනියි.

අන්‍යයන් හා මත ගැටුම් අවම කර ගනියි.

වැඩිහිටියන් සමඟ සම්බන්ධතා පවත්වයි.

සම වයස් කණ්ඩායම් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

ආචාර කරයි.

තමන්ගේ කටයුතු තනිව කර ගනියි.
ආගමික වතාවත් චාරිත්‍ර සිරිත් විරිත්වලට සහභාගි වෙයි.
ස්වභාවික අවශ්‍යතා පාලනය කරගැනීමට අවශ්‍ය වූ විට දැනුම් දෙයි.
ආහාරයට පෙර/ පසු අත සේදීම වැනි පිරිසිදුකමට අදාළ පුරුදු සහ තනිව ම /නිවැරදි ව ආහාර අනුභව කරයි.
සන්නිවේදන නිපුණතා ක්ෂෙත්‍රයට අනු නිපුණතා දහයක් ඇත. එය පහත සඳහන් පරිදි ය.
අවධානයෙන් සවන්දෙයි.
අදහස් වාචිකව ප්‍රකාශ කරයි.
වචන නිවැරදිව උච්චාරණය කරයි.
ඉඟි හා සිරුර බස භාවිත කරයි.
කවි ගී සිංදු ගායනය කරයි. (සිංහල , ඉංග්‍රීසි)
තම නම කියවෙන විට ප්‍රතිචාර දක්වයි.
සරල විධාන වලට ප්‍රතිචාර දක්වයි.
ගුරුවරයා කථාවක් කියන විට ඇහුම්කන් දෙයි.
තම නම පදිංචිය දෙමාපිය නම් ඇසූ විට ප්‍රකාශ කරයි.
ඉල්ලීමක් කරන විට නැටුමක රංගනයක, ගායනයක, ක්‍රියාකාරකමක චරිත නිරූපණයක යෙදෙයි.
නිර්මාණාත්මක නිපුණතා සම්බන්ධ ව අනු නිපුණතා පහකි. එනම්;
චිත්‍ර අඳියි.
ඇඹීම සහ අත්වැඩ කරයි.
ඇඟිලිවලින් කොළ ඉරා නිර්මාණයක් කරයි.
තමා විසින් අඳින ලද චිත්‍රයක් පිළිබඳ විස්තර කරයි.
රූප ඇඳීම, ඇලවීම, පාට කිරීම, ඉඳිකිරීම වැනි නිර්මාණීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
භාෂා සංකල්ප ආශ්‍රිත නිපුණතා නවයකි. එය පහත සඳහන් වෙයි.
වචන මාලාව තේරුම් ගනියි- වාචික
දෘශ්‍ය විභේදනය හැකියාව ප්‍රදර්ශනය කරයි.
වාචික ඉංග්‍රීසි භාවිත කරයි.
ශ්‍රවන විභේදනය හැකියාව ප්‍රදර්ශනය කරයි.
පින්තූර භාවිතයෙන් නිර්මාණ කරයි.
පෙර ලිවීම අභ්‍යාස කරයි.
පෙර කියවීම අභ්‍යාස කරයි.
පින්තූර මගින් සරල ප්‍රකාශ ගොඩ නගයි.
පින්තූර ඇසුරින් සරල කතන්දර ගොඩ නගයි. සහ ප්‍රකාශ කරයි.

ගණිත සංකල්ප ආශ්‍රිත නිපුණතා හයකි.

1 සිට 10 දක්වා ගණන් කරයි.

ද්‍රව්‍ය 2ක කට්ටලයක් පාට අනුව හැඩය අනුව තරම අනුව වර්ගය අනුව තෝරයි.

ද්‍රව්‍ය සංඛ්‍යාවක් එක් අයෙකුට එකක් වන සේ බෙදයි.

දිශාගත පේළියක ඉදිරියෙන් ම හා පිටුපසින් ම සිටින්නා හඳුනා ගනියි.

ද්‍රව්‍ය තුනක් විශාලත්වය අනුව අනුපිළිවෙලට තබයි.

රෑ දහවල යන සංකල්පය භාවිත කරමින් කාලය පිළිබඳ සිද්ධි ප්‍රකාශ කරයි.

ඉහත සඳහන් කර ඇත්තේ ප්‍රධාන නිපුණතා ක්ෂෙත්‍ර සහ ප්‍රධාන ක්ෂෙත්‍රවලට අයත් අනු නිපුණතාවන් ය.

## Abstract

The stage of Early Childhood is a decisive period for the foundation of holistic development process of the child. Hence directions pre school education towards a refined path emphasizing required competencies that child need to achieve via Pre School is necessary.

To achieve the four objectives of research literature was surveyed on the theatrical and research background on the theme of pre school. There is a dearth of local literature and as a result the researcher tried to concentrate on foreign literature. According to literature background there were important factors. The value of early childhood education, especially education that focuses on the pre school years, has been emphasized for over 2000 years. Writers from every historical epoch have noted the malleable nature of children in what we now tern the pre school years. Writers have also considered socialization and educational experiences important to children's development as valued and productive members of society. Maria Montessori may be seen as the intellectual successor to Rousseau, Oberlin, and Froebel within the European "School of Nature". Her interest in early education emerged from her interest in applying the sensory training techniques of Itard and Seguin to her own work with severely retarded and insane children.

Data were collected in two steps. During the first pace data were collected based on a preliminary list of competencies. During the second pace a sub sample was used to list out the final competencies that was used for the research. Data were collected from thirty pre schools, 100 pre school teachers, thirty school with primary section and hundred teachers. In addition got academic person for advance advice. 10% sample was used in 2nd pace.

Findings were as follows;

- The patterns of pre schools have similar pattern that of of primary schools. Hence pre schools show a primary school model.
- Pre school try to impart competencies that provided by primary school.
- The language used is mixed with Sinhala and English languages.

- Te competencies pre schools have impart can be grouped in to categories there are
    - Physical ( rough and smooth)
    - Persional and social development
    - Communications
    - Creativity
    - Language concept
    - Basic mathematics concept

**Physical** ( rough) There are five competencies.

Use correct postural for wolking and sitting.

Climbing, jumping.

Rolling.

Distension a ballon.

Ryding .

**Physical** ( smooth) There are six competencies.

Hanging a pencil.

Tarn a page of a book.

Pasting full pictuters (piece of pictures)

Use scicores correctly.

Clipping flowers to a Eakle.

Collering in to the bounding of a shape.

**Persional and social development** There are twelve competencies

Identification of boddy parts.

Patience.

Working till lasting.

Like to the leadership and becoming leader.

Connection with elders.

Co-operation with peer group.

Courteous.

Self working.

Take part religion obsevences and manners.

Wash their hands before the meal.

**Communications**. There are ten competencies.

Listning.

Tell their idias vocable.

Pronunciation.

Boddy language.

Singing poems and songs. (Sinhala &English)

Know their name.

Know commands.

Know their living and names of parents.

Dancing, singing, acting.

**Creativity** There are five competencies

Drowing.

Craft.

Discribing picture.

Pasting a picture.

**Language concept** There are nine competencies

Vocabulary.

Descrimination of visual.

Oral English.

Descrimination of hearing.

Creating from picture.

Pre writing.

Pre reading.

Use a picture for talk about simple story.

**Basic Mathematics concept** There are six competencies

Counting 1 to 10.

Selecting a two group according of shape and size.

Identify fist person and last person of a line.

Selecting three materials according to the order.

Telling about night and noon and Choose material two groups.